**සිසුරු**

සිසුන්ගේ ශිෂ්‍යත්ව සාධන මට්ටම සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය

5 ශ්‍රේණිය - 2021

මිනුවන්ගොඩ අධ්‍යාපන කලාපය - ප්‍රාථමික අංශය

පෙරහුරු ප්‍රශ්න පත්‍ර අංක - 01

II පත්‍රය

නම: ....................................................................... කාලය පැය 1 මිනිත්තු 15 යි.

1. මෙම ඡේදය කියවා **ඡේදය ඇසුරෙන් ම** පිළිතුරු ලියන්න.

වර්තමානයේදී ක්ෂණික ආහාර භාවිතය දරුවන් අතර බහුල වී ඇත. ඉතා ම කෙටි කාලයක් තුළ දී පිළියෙල කර ගත හැකි මෙම ආහාර අතර ඇති නූඩ්ල්ස් , සිසිල් බීම, සොසේජස් වැනි ආහාර ගැනීමට ළමයි කැමැත්තක් දක්වති. ක්ෂණික ආහාර ගැනීම නිසා දරුවන්ගේ ශරීර ශක්තිය අඩුවීම, මතක ශක්තිය අඩුවීම ආදිය සිදුවන අතර එමගින් විවිධ ලෙඩ රෝග වලට ගොදුරු වීමද සිදුවේ. ශරීරයට අවශ්‍ය පෝෂණය ක්ෂණික ආහාර වලින් ලබා ගත නොහැකි අතර එමගින් ලැබෙන්නේ ක්ෂණික ශක්තියක් පමණි.

i. මෙම ඡේදයෙන් විස්තර කරන්නේ මොනවා භාවිතය පිළිබඳවද?
.......................................................................................................................

ii. මෙහි සඳහන් ආහාර වර්ග නම් කරන්න.
.......................................................................................................................

iii. ක්ෂණික ආහාර ගැනීම නිසා දරුවන්ගේ අඩුවන්නේ මොනවාද?
.......................................................................................................................

iv. මෙහි සඳහන් වර්තමානකාල ප්‍රාණවාචී බහු වචන ක්‍රියා පදයක් ලියන්න. ....................................

v. තාලුජ අක්ෂරයක් සහිත වචනයක් ඡේදයෙන් තෝරා ලියන්න. ...............................................

vi. වර්තමානයේදී යන පදයට විරුද්ධාර්ථ පදය ලියන්න. ..........................................................

vii. මූර්ධජ අකුරු දෙකක් සහිත වචනයක් ලියන්න. ..............................................................

2. පහත සඳහන් වාක්‍යවල හිස්තැනට අදාළ නිවැරදි වචනය වරහන් තුළින් තෝරා ඊට යටින් ඉරක් අඳින්න.

I. වහාම .............. (බාණ්ඩාගාරය/භාණ්ඩාගාරය) භාර ඇමති වරයා කැඳවීය.

II. මේක හරිම .........(අසාධාරන/අසාධාරණ) කතාවක් නොවැ.

3. වචන ගලපා අර්ථවත් වාක්‍යයක් ගොඩ නගන්න.

I. අම්මා/එයි/නාගෙන/ඇළෙන්/සවස
.......................................................................................................................

II. අහසේ/ පාවෙයි/වලාකුළක් /මහ/නිල්
.......................................................................................................................

මිනුවන්ගොඩ අධ්‍යාපන කලාපය - ප්‍රාථමික අංශය

4. නිවැරදිව ලියා ඇති වචනය තෝරන්න.
   I. අනුබවය / රැක්ෂය / විස්මයට / ප්‍රදේෂය
   II. ඖෂධ / නිර්මාන / කෞතුකාගාරය / බාණ්ඩ
5. ගැළපෙන යුගල පද යොදා වාක්‍ය සම්පූර්ණ කරන්න.
   i. අපි ......................................පිරිසිදුව තබා ගනිමු.
   ii. අපේ .....................................අලංකාරව තබා ගන්මු.
   (තෑගි බෝග / ගෙවල් දොරවල් / වතු පිටි)
6. i. හිස්තැන් පුරවන්න.
   ගඟට .......................................වගේ
   iii. ප්‍රස්තාව පිරුළෙහි අදහස ලියන්න.

   කැකිල්ලේ රජ්ජුරුවන්ගේ නඩු තීන්දුව වගේ

   ...........................................................................................................
7. පහත දී ඇති අදහස් වල ඉඟි වැකිය ලියන්න.
   i. දැඩි සතුටට පත්වීම.
   ....................................................................................
   ii. අධික වර්ෂාව
   ....................................................................................
8. පහත දී ඇති වාක්‍ය වල හිස්තැනට සුදුසු වචන වරහන් තුළින් තෝරාගෙන යටින් ඉරක් අඳින්න.
   i. ............(ඇය/ඔහු) පොත් බෑගය මේසය උඩින් තැබුවේය.
   ii. ගෙවිලිය ඇඹුල රැගෙන ................(ගියේය/ගියාය).
9. පහත සඳහන් වැකිය අතීත කාල බහු වචනයට හරවා ලියන්න.
   තාත්තා වැඩට යයි.
   .........................................................................
10. පහත දී ඇති ඉංග්‍රීසි වචන සඳහා යෙදෙන සිංහල වචනය ලියන්න.
   i. Vegetables ............................
   ii. Picture ................................
11. පහත දී ඇති වාක්‍ය වල හිස්තැනට සුදුසු වචනය වරහන් තෝරා හිස්තැනෙහි ලියන්න.
   i. There ...................(are/is) two trees in picture.
   ii. I ......................(has/have) a pet.
12. පහත දී ඇති වාක්‍යයේ අර්ථය ඉංග්‍රීසියෙන් ලියන්න
   May i go to the playground ? ..........................................................................................
13. පහත සඳහන් දෙමළ වචන වල අර්ථය සිංහලෙන් ලියන්න.
   i. පදිනෛන්දු ..........................................
   ii. සාප්පිඩුංගළ් ........................................
14. මෙම වාක්‍ය දෙමළෙන් කියන ආකාරය සිංහලෙන් ලියන්න.
   සමන් ඇතුළට එන්න. ...................................................................

15. සොබා දහමේ අපූර්වත්වය මැනවින් විඳ ගත හැකි ගම්මාන තවමත් අප රටේ ඉතිරිව ඇත. ඇළ දොළ වල සුන්දරත්වය නොඅඩුව එහි පවතී. **<u>අපේ ගම</u>** යන මාතෘකාව යටතේ වාක්‍ය තුනක් ලියන්න. (සෑම වාක්‍යකම වචන පහකට වඩා වැඩියෙන් තිබිය යුතුය. උක්ත ආඛ්‍යාත සම්බන්ධය හා අක්ෂර වින්‍යාසය නිවැරදි විය යුතුය.)

1. ..............................................................................................................................


..............................................................................................................................

2. ..............................................................................................................................

..............................................................................................................................

3. ..............................................................................................................................

..............................................................................................................................




16. මෙම ගණක රාමුවෙහි ඇති සංඛ්‍යාවේ සංඛ්‍යා නාමය ලියන්න.

.............................................................

17.


| | |
|---|---|
| 0 | 9 |
| 1 | 2 |

මෙම කොටුව තුළ ඇති ඉලක්කම් සියල්ල භාවිත කර සෑදිය හැකි කුඩාම සංඛ්‍යාව ලියන්න.

.................................

18. මුහුණත් හතරම හැඩයෙන් සමාන ඝන වස්තුව කුමක්ද?..........................................................

19. මෙම රූපයේ පාට කළ කොටස දශම සංඛ්‍යාවක් ලෙස ලියන්න.



........................................

20.  බැලූන් ගණන රෝම ඉලක්කමෙන් ලියන්න.................

21. වැඩ සටහනක් පෙ. ව. 10.30 ට ආරම්භ වී ප. ව. 1.00 ට අවසන් විය. වැඩසටහන පැවති කාලය කොපමණද?

පැය .................. මිනිත්තු ......................

22. මෙම සංඛ්‍යා රටාවේ ඊ ළඟ සංඛ්‍යා දෙක ලියන්න.

54, 45, 50, 40, 46, ............, .....................

23. සමාධි කඩයට ගොස් එකක් රුපියල් 48.00 වන පොත් 3 ක්ද, එකක් රුපියල් 75.00 ක් වන පොත් 4 ක්ද මිලට ගත්තාය.

i. ඇය පොත් සඳහා ගෙවූ මුදල කොපමණද? ........................

ii. ඇය එම මුදල ගෙවීමට රු. 1000 ක් දුන් විට ඇයට ලැබෙන ඉතුරු මුදල කීයද? ...........................

24. වෙළෙන්දෙක් සීනි 3 Kg 500g මිලට ගෙන ඒවා 200g බැගින් ඇසුරුම් වල අසුරන ලදී.

i. ඔහු අසුරණ ලද පැකට් ගණන කොපමණද? ..........................................

ii. ඉතිරි වූ සීනි ප්‍රමාණය කොපමණද? .....................................................

25. පොල්තෙල් බොතලයක පොල් තෙල් 2l 50ml තිබුණි. ආහාර පිසීම සඳහා එයින් පොල් තෙල් 1l 250ml ප්‍රමාණයක් ලබා ගත් පසු ඉතිරි වූ පොල් තෙල් ප්‍රමාණය කොපමණද?

...................................................

26. 1206, 2670, 3407 යන සංඛ්‍යා වලින් 4 න් බෙදූ විට 3 ක් ඉතිරි වන සංඛ්‍යාව කුමක්ද?

.........................................

27. අඹ ගෙඩි 32 කින් $\frac{3}{4}$ ක් ඉදී ඇත. ඉතිරි ඒවා අමු අඹය.

i. ඉදී තිබුණු අඹ ගෙඩි ගණන කීයද? ...........................................

ii. අමු අඹ ගෙඩි ප්‍රමාණය දෙදෙනෙකු අතර සමානව බෙදුවේ නම් එක් අයෙකුට ලැබුණු අඹ ගෙඩි ගණන කොපමණද? ..................................................

28. ත්‍රී රෝද රියක තුන් දෙනෙකුට ගමන් කළ හැකිය. 60 දෙනෙකුට යෑමට අවශ්‍ය ත්‍රී රෝද රථ ගණන කීයද? ..........................................................

29. පසන් තම නිවසේ සිට මීටර 20ක් නැගෙනහිර දිශාවට ගොස් වම් අත පැත්තට හැරී තවත් මීටර 20 ක් ගමන් කර බස් නැවතුමට ළඟා වෙයි. බස් නැවතුම පිහිටා පසන්ගේ නිවසට කුමන දිශාවෙන්ද?

...............................................................

30. මීටර 5 ක් දිග කම්බියකින් සෙන්ටි මීටර 25 බැගින් කුඩා කම්බි කැබලි 7 ක් කපා ගන්නා ලදී. එවිට ඉතිරි වූ කම්බි කැබැල්ලේ දිග කොපමණද? .......................................................

- අංක 31 සිට 60 තෙක් ප්‍රශ්න වල දී ඇති පිළිතුරු අතුරෙන් තෝරා ඉරක් අඳින්න.

31. අපි සැමවිටම කටයුතු කළ යුත්තේ,
    I. අන් අයට විරුද්ධවය.
    II. අන් අයගේ හිත් නොරිදෙන පරිද්දෙනි.
    III. අන් අයගේ අවශ්‍යතාවයන් ඉටුවන පරිද්දෙනි.

32. ආක්‍රමණශීලී චර්යා ඇති අයෙකු පිළිබඳ නිවැරදි ප්‍රකාශය තෝරන්න.
    I. ඔහුට සියලු දෙනාම අබිබවා නැගී සිටිය හැක.
    II. ඔහු සියලු දෙනා තුළින් ප්‍රතික්ෂේප වීම සිදුවේ.
    III. සැම දෙනාගේ ගෞරවයට ලක් විය හැක.

33. නිවැරදි ප්‍රකාශය තෝරන්න.
    i. සැමවිටම සරල දිවි පැවැත්මට හුරුවෙමු .
    ii. සැමවිටම සංකීර්ණ දිවි පැවැත්මට හුරු වෙමු.
    iii. සැමවිටම තරගකාරී ජීවිතයකට හුරු වෙමු.

34. අන් අයගේ ක්‍රියා කලාපය නිසා අප අපහසුතාවයට පත්වන අවස්ථාවක් නොවන්නේ,
    i. බස් රියේදී අධික ශබ්දයෙන් කැසට් යන්ත්‍රය ක්‍රියාත්මක කර ඇති විට
    ii. පිළිවෙළට පෝළිමේ සිටිමින් තම අවස්ථාව උදාකර ගන්නා අවස්ථාවක්
    iii. සිසුන් පිරිසක් මාර්ගයේ සෙල්ලම් කරමින් සිටින අවස්ථාවක්

35. අපේ සිරිතක් ලෙස සැලකිය නොහැක්කේ,
    i. වැඩිහිටියන් සමඟ එකට එක කතා කිරීම.
    ii. වැඩිහිටියන් දුටු විට අසුනෙන් නැගිටීම.
    iii. කෑමට පෙර සබන් ගා අත් සේදීම.

36. අඩුවෙන් ජලය පානය කිරීම නිසා ඇති විය හැකි අහිතකර ප්‍රතිඵලයකි,
    i. සම පැහැපත් වීම.
    ii. වකුගඩු නිරෝගී වීම.
    iii. රෝගාබාධ ඇතිවීම.

37. මගේ සිතේ සැනසීම මගේ යහළුවන්ටත් දැනේවා මෙසේ සිතමින් කටයුතු කරන්නේ සිත් පහන් කිරීමේ ක්‍රියාකාරකමේ කුමන පියවරේදීද?
    i. පස්වැනි පියවරේදී
    ii. දෙවැනි පියවරේදි
    iii. හතරවැනි පියවරේදී

38. අප අවට පරිසරයේ ස්වාභාවිකව නිර්මාණය නොවූ බිමක් වන්නේ මින් කුමක්ද?
    i. තණකොළ සහිත බිම
    ii. වැලි සහිත බිම
    iii. පිගන් ගඩොල් ඇල්லූ බිම

39. ලංකාවේ මුල්ම රාජධානිය වන්නේ

i. පොළොන්නරුව

ii. අනුරාධපුරය

iii. දඹදෙනිය

40. ඔලිඳ පුවරුවක දෙපැත්තේම ඇති මුළු සිදුරු ගණන කීයද?

i. 7 කි

ii. 20 කි

iii. 14කි.

41. ලංකාවේ මුහුදුබඩ සහිත පළාත් වන්නේ

i. මධ්‍යම, දකුණ , උතුර

ii. දකුණ, උතුරු මැද, සබරගමුව

iii. දකුණ, බස්නාහිර, වයඹ

42. දූපතක් යනු,

i. මිරිදියෙන් වට වූ ගොඩබිමකි.

ii. කරදියෙන් වට වූ ගොඩබිමකි.

iii. ජලයෙන් වට වූ ගොඩබිමකි.

43. ශාක වර්ධනයට අනිවාර්යයෙන්ම අවශ්‍ය සාධක සහිත පිළිතුර තෝරන්න.

i. ජලය, මාධ්‍ය, පොහොර, වාතය

ii. ජලය, හිරු එළිය, මාධ්‍ය, වාතය

iii. පොහොර, හිරු එළිය, ජලය, වාතය

44. අනාරක්ෂිත අවස්ථාවක් වන්නේ මින් කුමක්ද?

i. අකුණු ගසන විට පිට්ටනියක සිටීම.

ii. ළිඳකින් නෑම

iii. දුම්රියේ ගමන් කිරීම

45. ගොවියාට හිතකර නිශාචර සත්වයෙකි.

i. ගොළු බෙල්ලා

ii. කණාමැදිරියා

iii. බකමූණා

46. සිදුරු කැමරාවෙන් අපට ලැබෙන ප්‍රතිබිම්බය

i. උඩුකුරුය

ii. යටිකුරුය

iii. කුඩාය.

47. සාරිය, වේට්ටිය අඳින ජන වර්ගය වන්නේ,

i. මුස්ලිම්

ii. දෙමළ

iii. සිංහල

මිනුවන්ගොඩ අධ්‍යාපන කලාපය - ප්‍රාථමික අංශය

48. පතල් කර්මාන්තයේදී පතලක හාරන හරස් මාර්ගය හඳුන්වන්නේ,
   i. නාම්බුව
   ii. දෝනාව
   iii. ඉල්ලම
49. කොළඹ සිට අවිස්සාවේල්ල දක්වා දිවෙන දුම්රිය මාර්ගය හඳුන්වන නම වන්නේ,
   i. මුහුදුබඩ දුම්රිය මාර්ගය
   ii. කැලණිවැලි දුම්රිය මාර්ගය
   iii. උඩරට දුම්රිය මාර්ගය
50. පක්ෂියෙකුගේ රූපයක ලාංඡනය සහිත රාජ්‍ය ආයතනය වන්නේ,
   i. ජාතික රූපවාහිනිය
   ii. ස්වාධීන රූපවාහිනිය
   iii. විදුලි බල මණ්ඩලය
51. වාහන අංක තහඩුවක මුලින්ම ඇති ඉංග්‍රීසි අක්ෂර වලින් දැක්වෙන්නෙ,
   i. හිමිකරු අයිති පළාත
   ii. හිමිකරු අයත් දිස්ත්‍රික්කය
   iii. වාහන ගෙන්වූ රටයි
52. පුස්තකාලයකදී අප සැලකිළිමත් විය යුතු කරුණක් නොවන්නේ,
   i. රගෙන ගිය පොත් ආපසු භාර දිම
   ii. නිශ්ශබ්දතාවය
   iii. අනෙක් අය කියවන පොත් පිළිබඳ විමසීම
53. ශ්‍රී ලංකාවට පැමිණෙන සංචාරක පක්ෂියෙකි
   i. වළි කුකුළා
   ii. කැහි බෙල්ලා
   iii. සුදු රෙදි හොරා
54. සුළඟ උපයෝගී කර ගනිමින් වාදනය කරන සංගීත භාණ්ඩයක් නොවේ.
   i. වයලීනය
   ii. බටනලාව
   iii. ගිටාරය
55. ආහාර වමාරා කන සතෙකු වන්නේ
   i. මයිනා
   ii. එළුවා
   iii. ගවයා
56. ඕපනායක යෝධ පුස් වැල පිහිටි පළාත වන්නේ
   i. උතුරු මැද පළාත
   ii. සබරගමු පළාත
   iii. වයඹ පළාත

57. ප්‍රෝටීන් අඩංගු ආහාර නොලැබුණු විට සිදුවන දෙයකි.

   i. ශරීරයේ පිරිපුන් වබ හීන වීම
   ii. සම ඉරි තැලීම
   iii. ශරීර වර්ධනය හීන වීම

58. කාලයක් ගතවී මල් පිපෙන ශාකයකි.

   i. අරලිය
   ii. රෝස
   iii. ඕකිඩ්

59. අධිවේගී මාර්ගයේ කෙටි දුරකථන අංකය වන්නේ.

   i. 1929   ii. 1919   iii. 1969

60. කදෙහි මල් හට ගන්නා ශාකයකි.

   i. කොස්
   ii. සල්
   iii. අඹ

මිනුවන්ගොඩ අධ්‍යාපන කලාපය - ප්‍රාථමික අංශය

<u>පිළිතුරු ii පත්‍රය</u>

1. i. ක්ෂණික ආහාර භාවිතය පිළිබඳ
ii. නූඩ්ල්ස්, සිසිල් බීම , සොසේජස්
iii. ශරීර ශක්තිය අඩු වීම, මතක ශක්තිය අඩු වීම
iv. දක්වති
v. ශරීර
vi. අතීතයේදී
vi. පෝෂණය

2. i.භාණ්ඩාගාරය ii. අසාධාරණ

3.i. අම්මා සවස ඇළෙන් නාගෙන එයි.
ii. නිල් අහසේ මහ වලාකුළක් පාවෙයි.

4.i. විස්මයට ii. කෞතුකාගාරය

5.i ගෙවල් දොරවල් ii වතු පිටි

6.i ඉණි කැපුවා
ii. තීරණ ගැනීමේදී බුද්ධිමත් ලෙස කටයුතු නොකර නුසුදුසු තිරණ ගැනීම.

7. i. ඉහේ මලක් පිපුණා ii. මොරසූරන වැස්ස

8. i. ඔහු ii. යියාය

9. තාත්තලා වැඩට ගියෝය

10. i. එළවළු ii .පින්තූරය

11. i. are ii. have

12. මම ක්‍රීඩා පිටියට යන්නද?

13. i පහළොව ii කන්න

14. සමන් උල්ලේ වාරුංගල්

15.

16. පන් දහස් දෙසීය තුන 17.1029 18. චතුස්තලය 19. 0.4 20. ix

21. පැ.2 මි.30 22. 35, 42 23. i. රුපියල් 444.00 ii. රුපියල් 556.00 24. i. 17 ii. 100g 25. 800ml 26.3407 27. i. 24 ii. 4 28.20 29.ඊසාන

30. 225cm/2m 25cm

31-ii 32-ii 33-I 34-ii 35-I 36-iii 37-iii 38-iii 39-ii 40-iii 41-iii 42-iii 43-ii 44-I 45-iii 46-ii 47-ii 48-ii 49-ii 50-i 51-I 52-iii 53-iii 54-iii 55-iii 56-ii 57-iii 58-iii 59-iii 60-ii

මිනුවන්ගොඩ අධ්‍යාපන කලාපය - ප්‍රාථමික අංශය

පිළිතුරු i පත්‍රය

1-ii,
2-iii
3-iii
4-i
5-i,
6-iii,
7-I,
8-iii,
9-ii,
10-iii,
11-ii,
12-ii,
13-I,
14-ii,
15-iii,
16-iii,
17-ii,
18-ii,
19-iii
20-i

21-iii
22-iii
23-ii
24-ii
25-i
26-ii
27-iii
28-iii
29-ii
30-iii
31-ii
32-ii
33-කුකුළා
34-චතුස්තලය
35-මඩොල්දූව
36-iii
37-i
38-iii
39-ii
40-i

මිනුවන්ගොඩ අධ්‍යාපන කලාපය - ප්‍රාථමික අංශය

මිනුවන්ගොඩ අධ්‍යාපන කලාපය - ප්‍රාථමික අංශය